'ඔබ අතරින් කිසිවෙකු හෝ ගල්කැට තුනකට වඩා අඩුවෙන් පිරිසිදු නොකළ යුතුයි.'

සල්මාන් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. බහුදේවවාදීහු අපට මෙසේ පවසා සිටියහ: "සැබැවින්ම මම ඔබේ සගයාව දකින්නේ, ඔහු මළපහ කිරීම ගැන පවා ඔබලාට උගන්වන අයකු ලෙස ය." එවිට ඔහු: "එසේය, සැබැවින්ම අප අතරින් කිසිවෙකු හෝ තම
දකුණතින් පිරිසිදු කිරීම හෝ කිබ්ලාවට මුහුණ ලෑම එතුමාණෝ වැළැක්වූහ. එමෙන්ම
ගොම හා අස්ථි කොටස්වලින් පිරිසිදු කිරීම ද වැළැක්වූහ. එමෙන්ම එතුමාණෝ මෙසේ
පවසා සිටියහ: 'ඔබ අතරින් කිසිවෙකු හෝ ගල්කැට තුනකට වඩා අඩුවෙන් පිරිසිදු නොකළ යුතුයි.'
[صحيح] [رواه مسلم]

සල්මාන් අල්-ෆාරිසී (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසයි: "බහුදේවවාදීහු සමච්චලයට අපට මෙසේ පවසා සිටියහ:" "සැබැවින්ම ඔබේ වක්තෘවරයා ඔබට සෑම දෙයක්ම උගන්වයි. මළ මූත්රා කරන ආකාරය පවා ඔබට උගන්වමින් සිටියි." එවිට සල්මාන් තුමා මෙසේ පැවසීය: "ඔව්, අපි මළ මූත්රා කිරීමේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම එතුමාණෝ අපට උගන්වා ඇත. මළ මූත්රා කිරීමෙන් පසු තම දකුණතින් පිරිසිදු කිරීම එතුමාණන් අප වළක්වා ඇත. එය දකුණත අපවිත්ර දැයින් ආරක්ෂා කිරීමක් හා එයට කරන ගරු කිරීමක් වශයෙනි. එමෙන්ම මළ මූත්රා කරන අවස්ථාවේ කිබ්ලාවට මුහුණ ලෑමෙන් ද අප වළක්වා ඇත. තවදුරටත් සත්ව ගොම, සත්ව කොටස් හා අස්ථි කොටස්වලින් පිරිසිදු කිරීම ද වළක්වා ඇත. එමෙන්ම පිරිසිදු කිරීමේ දී ගල්කැට තුනකට වඩා අඩු ප්රමාණයකින් සීමා නොකර ගත යුතු යැයි ද දන්වා ඇත."

https://sunnah.global/hadeeth/si/show/10048